## එම්.එම්.එන්.ඉන්ද්‍රරත්න එ. ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම

RTIC Appeal 1161/2019 (පුද්ගලික වශයෙන් විභාග කිරීම) තොරතුරු දැනගැනීතේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රිතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය සහ රීති අනුව - 2019.07.30 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද.

**සභාපති:** මහින්ද ගම්මන්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතීඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - එම්.එම්.එන්.ඉන්ද්‍රරත්න
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ

**පෙනීසිටීම**
**අභියාචක -** එම්.එම්.එන්.ඉන්ද්‍රරත්න
**පොදු අධිකාරිය -** එම්.සී.ජී.මහීපාල - ප්‍රධානී මානව සම්පත් - තොරතුරු නිලධාරිනී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.07.24 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2018.09.17 |
| නම් කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.09.21 |
| නම් කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.10.11 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.10.11 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.
*ආගමන විගමන දෙපාර්තුමේන්තුවේ ගුවන් තොටුපොළ පැමිණීමේ පර්යන්තයේ ජේ.බ.නි. සහ කාරයභාර නිලධාරී කාමර අවට CCTV දර්ශන*

තොරතුරු නිලධාරියා 2018.09.07 දිනැතිව අභියාචක වෙත දන්වා ඇත්තේ ඉල්ලා ඇති CCTV දර්ශන මේ වන විට ස්වයංක්‍රීයව මැකී ගොස් ඇති බව ගුවන් තොටුපොළ ආරක්ෂක අංශය මගින් දන්වා ඇති බැවින් අදාළ තොරතුරු අභියාචක වෙත සැපයීමට නොහැකි බවයි .මෙයින් අතෘප්තියට පත් අභියාචක 2018.09.21 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. පනතේ සඳහන් නියමිත

කාලය තුළ නම්කළ නිලධාරියා ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක විසින් 2018.10.11 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ සිටින ලදී.

අභියාචක කොමිෂන් සභාවට පැහැදිලි කර සිටියේ ඔහු නිශ්චිත දිනක සහ වේලාවක CCTV දර්ශන ඉල්ලා ඇති බවත්, එය එක් මසක් පසුවූ විගස ස්වයංක්‍රීයව මැකී ගොස් ඇති බව දැන්වූ නමුත් අභියාචකට පොලිසිය මගින් දැනුම් දුන් ආකාරයට එම CCTV දර්ශන පොලිසියට හිමිවී ඇති බවත් ජූලි මස 24වන දින අදාළ යම් දර්ශන ඔහුට පෙන්වා ඇති බවත් පවසා සිටින ලදී. එසේ නම් මැකී ගොස් ඇතැයි කියා ඇති දර්ශන මසක් පසු වීමට පෙර පොලිසියට ලැබුනේ කෙසේ දැයි හා ඔහුට නොලැබුනේ කුමන හේතුවක් යටතේද ප්‍රශ්න කරයි. තොරතුරු නිලධාරිණිය කිසිදු පොලිස් පරීක්‍ෂනයක් පිළිබඳ නොදන්නා බව සඳහන් කළ අතර, ආරක්‍ෂක අංශය විසින් ඇයට දැනුම් දී ඇත්තේ CCTV දර්ශන මැකී ගොස් ඇති බවය. තවද තොරතුරු නිලධාරිණිය, තමා විසින් නියමිත කාල සීමාව ඇතුලත ප්‍රතිචාර නොදක්වා ඇති බව පිළිගන්නා ලදී.

මෙම තොරතුරු වලට අදාළව පොලීසිය විසින් විමර්ශනයක් පවතින බව අවධාරණය වී ඇති බැවින් සහ එමගින් අභියාචක හට බරපතල චෝදනා එල්ල වී ඇති බව තහවුරු වී ඇති බැවින් වැඩි දුර කරුණු දැක්වීමක් දෙපාර්ශවය විසින්ම සිදු කළ යුතු පැහැදිලි විය.

අභියාචනය කල් තබන ලදී.
මීළඟ කැඳවීම් දිනය: 10.12.2019
******